## බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 15 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාව සතුව පවත්නා ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) මදුරාවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.221,804 ක මුදලක් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ලෙස දක්වා තිබූ බැවින් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ගිණුම්වල එය ලැබිය යුතු මුදලක් ලෙස දැක්විය යුතු වුවත් එම ගිණුම්වල මදුරාවල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු මුදලක් ලෙස රු.348,928 ක් දක්වා තිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.21,486,109 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.7,480,372 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.11,649,735 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,169,363 ක පසුබෑමක් දක්නට ලැබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,169,363 ක පසුබෑම කෙරෙහි වියදම් රු.13,663,228 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 2,094 | 1,691 | 487 |
| (ii) බලපත්‍ර ගාස්තු | 276 | 276 | -- |

2.2.2 **වරිපනම් බදු**

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම රු.2,052,880.20 ක් වූ අතර ඉන් රු.1,651,587.78 ක් හෙවත් සියයට 80.45 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය වූ රු.758,136 න් රු.713,267 ක් හෙවත් සියයට 94.08 ක් පමණක් අයකර තිබූ අතර වර්ෂය අවසානයට මුළු හිඟය රු.446,162 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ථ වරිපනම් බදු අයකිරීමේ ප්‍රගතිය සියයට 84.13 ක් විය.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට රු.446,162 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 01 සිට වසර 03 දක්වා ඒකක 93 කින් රු.18,587 ක්ද, වසර 03 සිට 05 දක්වා ඒකක 90 කින් රු.6,294 ක්ද, වසර 5 සිට වසර 10 දක්වා ඒකක 12 කින් රු.19,988 ක්ද ඇතුළත් විය. මෙම මුදල අයකරගැනීමට සභාව විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීම් සිදු කර නොතිබුණි.

2.2.3 <u>අක්කර බදු</u>

2015 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.140,462 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.54,160 ක් එනම් සියයට 38 ක් පමණක් අයකරගෙන තිබුණි. ප්‍රවර්තන බිල් කිරීම රු.40,887 ක් වූ අතර ඉන් රු.39,733 ක් හෙවත් සියයට 97 ක් අයකර තිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ අක්කර බදු ශේෂය රු.87,457 ක් විය.

2.2.4 <u>වෙනත් ආදායම්</u>

(අ) <u>වැලි තොටුපල ආදායම</u>

(i) වගකිව යුතු නිලධාරීන්ගේ කිසිදු අධීක්ෂණයක් හා නිවැරදි අභ්‍යන්තර පාලන ක්‍රමයක් අනුගමනය නොකරමින් පවත්වාගෙන ගිය වැලි තොටුපල ආදායම වැලි කියුබ් එකක මිල වැඩි වී තිබියදීත් 2015 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.1,030,905 කින් එනම් සියයට 331 කින් පහත වැටී තිබුණි.

(ii) මෙම වැලි තොටුපල ආශ්‍රිත ගනුදෙනු සම්බන්ධයෙන් ගබඩා භාර නිලධාරී, වැලි තොටුපල අධීක්ෂණ නිලධාරී සහ වැලි තොටුපල භාරකරු යන තිදෙනා විසින් නඩත්තු කර තිබූ තොග පොත්වලට අනුව අදාල ගනුදෙනුවල විශාල පරස්පරතාවයක් නිරීක්ෂණය විය.

(ආ) <u>දැන්වීම් පුවරු ආදායම්</u>

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත පරිදි කිසියම් දැන්වීමක් ප්‍රදර්ශණය කරවීමේදී සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොමැතිව දැන්වීම් පුවරු ප්‍රදර්ශණය කර තිබුණි. නියැදි විගණන පරීක්ෂාවේදී එසේ බලය ලබා නොගෙන ස්ථිර දැන්වීම් පුවරු 48 ක් හා බැනර් 34 ක් ප්‍රදර්ශණය කිරීම වෙනුවෙන් රු.49,506 ක ආදායමක් අයකරගෙන නොතිබුණි. 2016 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා සමීක්ෂණයක්ද සිදු කර නොතිබුණි. ගාස්තු අයකර ඇති දැන්වීම් පුවරු හඳුනාගැනීම සඳහා සංකේත යොදා නොතිබුණි.

(ඇ) <u>කසළ මධ්‍යස්ථානය ආශ්‍රිත ගනුදෙනු</u>

මෙම මධ්‍යස්ථානයේ නිෂ්පාදිත කාබනික පොහොර අලෙවිය සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. ණයට විකිණීම සම්බන්ධයෙන් කිසිදු සභා තීරණයක් නොතිබුණද, වර්ෂ ගණනාවක් තිස්සේ පොහොර අලෙවිය ණය පදනමට සිදු කොට තිබුණි. මෙලෙස 2016 දෙසැම්බර් 31 වන විට සභාවට ලැබී නොතිබූ සභාව විසින් හඳුනා නොගත් ලැබිය යුතු මුදල රු.45,750 ක් විය.

2.2.5 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,235,667 |
| (ii) | මුද්දර ගාස්තු | 7,643,596 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) බුලත්සිංහල ප්‍රාදේශීය සභාව 2006 අප්‍රේල් 15 දින සිට බුලත්සිංහල හා මදුරාවල යනුවෙන් ප්‍රාදේශීය සභා දෙකකට වෙන් කර තිබුණි. ඒ අනුව මදුරාවල ප්‍රාදේශීය සභාවට හිමි විය යුතු වත්කම් හා වගකීම් බෙදා වෙන් කර දිය යුතු වුවත් 2017 ජූලි 13 දින වන විටත් එම වත්කම් හා වගකීම් බෙදා වෙන්කරදී නොතිබුණි.

(ආ) **ඩබල් කැබ් රථය අනතුරකට පත්වීම**

සභාවට අයත් කැබ් රථයක් 2016 මාර්තු 11 දින හදිසි අනතුරකට පත්වී තිබූ අතර එම අනතුර සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) මුදල් රෙගුලාසි 102 ප්‍රකාරව හානි පාඩු ලේඛනයක් පවත්වා නොතිබුනු අතර අනතුර සම්බන්ධයෙන් සිදු වූ හානිය/අලාභය සටහන් කර නොතිබුණි.

(ii) අනතුර සම්බන්ධයෙන් පොලීසිය වෙත පැමිණිල්ලක් කර නොතිබුණි. මු.රෙ. 104(3) ප්‍රකාරව අලාභය සිදු වූ දින සිට දින 07 ක් ඇතුළත ප්‍රාරම්භක වාර්තාවක් නිකුත් කළ යුතු වුවත් එසේ නිකුත් කර නොතිබුණි.

(iii) මු.රෙ. 104(4) ප්‍රකාරව අලාභය/ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් 2017 ජූලි 13 දින වන විටත් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

(iv) වාහන අනතුර, අළුත්වැඩියාව, රක්ෂණ වන්දි ලැබීම හා මුදල් ගෙවීම සම්බන්ධව කිසිදු වාර්තාවක් සභාව විසින් ලේඛන ගත කර නොතිබුණි.

3.2 **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

2016 දෙසැම්බර් මසදී රු.2,857,155 ක් වැය කර නව ආයුර්වේද ගොඩනැගිල්ල හා රු.33,757,083 ක් වැය කර බුලත්සිංහල සති පොල සහිත වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු අවසන් කර තිබුණද 2017 ජූලි 13 දින වන විටත් එම ගොඩනැගිලි උපයෝජනයෙන් තොරව පැවතුණි.

3.3 **කොන්ත්‍රාත් පාලනය**

මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට රුපියල් මිලියන 3.4 ක ඇස්තමේන්තුවකට අනුව රු.2,974,347 ක ගිවිසුම්ගත මුදලකට කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණි.

(i) අනුමත සැලැස්මට අනුකූලව ගොඩනැගිල්ල ඉදි කර නොතිබුණි.

(ii) ගොඩනැගිල්ලේ පැති දෙකක පේව්මන්ට් යොදා නොතිබුණු අතර වැසිකිලි පද්ධතිය සඳහා ගලි බටය පමණක් යොදා වැසිකිලි වලක් ඉදි කර නොතිබුණි.

(iii) බැවුම් සහිත දකුණු පස පැති බැම්ම යොදා නොතිබුණි. ගොඩනැගිල්ල දෙපස ගල් සහ පස් ඉවත් කර නොතිබුණි. ඉදිරිපස අතුරා ඇති කුට්ටිගල් ගිලා බැස තිබුණි.

3.4 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණු අතර ඒ සඳහා බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අතුරු ව්‍යවස්ථාව පාදක කරගෙන තිබුණි. සභාව විසින් කසල බැහැර කරනු ලබන ස්ථානයට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

3.5 **කාර්යසාධනය**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ක්‍රියාකාරී සැලැස්මෙහි ආරම්භක දින සඳහන් කර තිබුණද අවසන් කරන දිනය නොදැක්වීමෙන් ඉලක්ක ගත දිනයන්හි සිදු කර ඇත්ද යන්න පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ii) වාහන නඩත්තු ඒකකය 2016 පෙබරවාරි මස ආරම්භ කිරීමට නියමිතව තිබුණද 2017 පෙබරවාරි මස වන විටත් අදාල කාර්යය ඉටු කර නොතිබුණි.

(iii) සභාවේ කර්මාන්ත ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොකිරීමෙන් කර්මාන්ත අංශයේ කාර්යසාධනය නිශ්චය කළ නොහැකි විය.

(iv) කසළ කළමනාකරණය විධිමත් කිරිම සඳහා කසළ බැරල් 119 ක් බෙදාදීම 2016 අප්‍රේල් වන විට අවසන් කළ යුතු වුවත් 2016 අප්‍රේල් 18 වන විට බැරල් 65 ක් පමණක් බෙදාදී තිබුණි.

(v) ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාවේ ගේට්ටුව හා තාප්පය අළුත්වැඩියාව සිදු කර නොතිබුණි.

(vi) ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව සතු මාර්ග ගැසට් කිරීම, සුසාන භූමි මැන වෙන්කිරිම, සභාව සතු සියළුම දේපල හඳුනාගැනීම 2017 පෙබරවාරි වන විටත් සිදු කර නොතිබුණි.

## 4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) අයවැයකරණය

(ඈ) වාහන පාලනය